# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2217/23 - 2021 මාර්තු මස 03 වැනි බදාදා - 2021.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙහි උපලේඛනයේ I වන තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළෙඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණය මත විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි.

මෙම නියමය 2021 මාර්තු මස 04 වැනි දින සිට ආරම්භ වන වසරක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

**මහින්ද රාජපක්ෂ,**
මුදල් අමාත්‍ය.

2021 මාර්තු මස 03 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.

1A - PG 5340 — 575 (2021/03)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළෙඳ භාණ්ඩය | | | | විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| 01 | 03.03 | 0303.54 | මැකරල් (ස්කොම්බර් ස්කොම්බ්‍රුස්, ස්කොම්බර් ඔස්ට්‍රාලසිකස්, ස්කොම්බර් ජැපොනිකස්) | කි. ග්‍රෑමයට රු. 6.00 |
| | | 0303.55 | ජැක් සහ හෝස් මැකරල් (Jack and horse mackerel - *Trachurus spp.*) | කි. ග්‍රෑමයට රු. 6.00 |
| 02 | 07.13 | 0713.31.22 | උඳු ඃ පිට කුරුට්ට ඉවත්කළ, පියළි කළ හෝ පියළි නොකළ | කි. ග්‍රෑමයට රු. 300.00 |
| | | 0713.31.29 | උඳු ඃ අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 200.00 |
| 03 | | 0713.35.90 | අනෙකුත් - කව්පි | කි. ග්‍රෑමයට රු. 70.00 |
| 04 | 10.08 | 1008.21.10 | බීජ - කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.21.90 | බීජ අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.29.10 | අනෙකුත් - කුරක්කන් (ඉලියුසිනේ කොරකාන විශේෂ) | කි. ග්‍රෑමයට රු. 70.00 |
| | | 1008.29.90 | අනෙකුත් (මිලට්) | කි. ග්‍රෑමයට රු. 70.00 |

03 - 447

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.